කොළඹ විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අර්ධ කාලීන) පාඨමාලාව 2021/2022 (සිංහල මාධ්‍ය)

2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා සති අන්තවල සහ අවශ්‍ය පරිදි වෙනත් රජයේ නිවාඩු දිනවල පැවැත්වෙන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා රජයේ පාසල්වල හෝ පුද්ගලික පාසල්, පිරිවෙන් සහ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතනවල හෝ සක්‍රිය සේවයේ නිරත වෙමින් සිටින උපාධිධාරීන්ගෙන් (අධ්‍යාපනවේදී නොවන) අයදුම්පත් කැඳවනු ලැබේ. පාඨමාලාව 2022 ජුනි මස පමණ ආරම්භ කිරීමට අපේක්ෂිතය.

**තෝරා ගැනීම :**

ලිඛිත පරීක්ෂණයක් (අපේක්ෂිත අයදුම්කරුවන් සංඛ්‍යාවට වඩා වැඩි වුවහොත්) හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**මධ්‍යස්ථානය :**

මෙම පාඨමාලාව කොළඹ දී පමණක් පැවැත්වේ. රටේ පවතින වසංගත තත්වය අනුව ඇතැම් විට මාර්ගගත ක්‍රමයට පැවැත්වීමට ද සිදුවිය හැක.

**ගාස්තු :**

පාඨමාලාව සඳහා ඉල්ලුම් කිරීමේ ගාස්තුව රු. 600/- කි.

පාඨමාලා ගාස්තුව රු 92,500/- කි.

**අයදුම් කිරීමේ උපදෙස්:**

අධ්‍යාපන පීඨ වෙබ් පිටුව හරහා https://edu.cmb.ac.lk/ මගින් පාඨමාලාව සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය ඉල්ලුම් පත්‍රය, විස්තර පත්‍රිකා සහ ගෙවීම් උපදෙස් ලබාගත හැකිය. ඉල්ලුම් පත්‍රයේ මුද්‍රිත පිටපතක් ගෙන එය නිවැරදිව සම්පූර්ණ කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සලස්වන්න.

සම්බන්ධීකාරක - පශ්චාත් උපාධි ඩිප්ලෝමා (අර්ධ කාලීන) පාඨමාලාව 2021/2022
අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ 03.

සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් පීඨය වෙත ලැබිය යුතු අවසන් දිනය 2022.05.20.

ලේඛකාධිකාරී
කොළඹ විශ්වවිද්‍යාලය,

2022.04.18